

# ශ්‍රී ලංකාවේ

# 2009 යුද්ධයේ

# මියගිය සංඛ්‍යාවන්

INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

# ශ්‍රී ලංකාවේ 2009 යුද්ධයෙන් හානිපත්වූවන්ගේ සංඛ්‍යා

2009ට පෙර මරණයට පත් දස දහස් සංඛ්‍යාත හමුදා සෙබළුන්, එල්ටීටීඊ සාමාජිකයන් සහ සිවිල් වැසියන්ගේ සංඛ්‍යාවන් මෙහි ඇතුළත් නොවේ.

| 2009 යුද්ධයෙන් හානිපත් වූවන් පිළිබඳ ඇස්තමේන්තු සඳහා මූලාශ්‍ර[1] | මරණ | තුවාල ලත්[2] | එකතුව |
|---|---|---|---|
| **2009 ජනවාරි - අප්‍රේල් එක්සත් ජාතීන්ගේ යථාකාල සමීක්ෂණය** | | | |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අර්බුද මෙහෙයුම් කණ්ඩායමේ ත්‍රිකෝණික දත්ත[3] ("ගාෂ් ටෙලෙක්ස්" පණිවිඩවල උපුටා දක්වා ඇති) | 7,737 | 18,479 | 26,216* |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අර්බුද මෙහෙයුම් කණ්ඩායමේ (COG) සමස්ත දත්ත[4] | 17,810 | 36,905 | 54,715 |
| **යුද්ධයේ අවසන් සතිය - 2009 එක්සත් ජාතීන්ගේ ඇස්තමේන්තුව** | | | |
| 2009 මැයි 10 - 18 වක්වා කාලය තුළ එක්සත් ජාතීන්ගේ වාසස්ථාන විශ්ලේෂණ දත්ත උපුටා දක්වන එක්සත් ජනපද රජය[5] | | | 7-17,000 |
| වැඩිකොට දක්වා ඇති බව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් කල්පනා කරන එල්ටීටීඊ සංවිධානය විසින් හෙළිකළ හානිපත්වූවන් පිළිබඳ සංඛ්‍යා උපුටා දක්වන එක්සත් ජනපද රජය[6] | | | 25,000 |
| **2009 ජනවාරි - මැයි අවසාන යුද්ධය - එක්සත් ජාතීන්ගේ ඇස්තමේන්තුව** | | | |
| 2009 යුද්ධයේදී ජන සංඛ්‍යා ගණන් හිලව්වලට ඇතුළත් නොකළවුන් පිළිබඳ (පෙට්‍රි වාර්තාවේ) ඇස්තමේන්තුව[7] | 70,000 | | |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂඥ මඩුල්ල ඇස්තමේන්තු කළ සිවිල් වැසියන්ගේ මරණ | 40,000 | | |
| "සාක්ෂිකරුවන් නොමැති යුද්ධය" විසින් එළිදැක්වූ වාර්තාව - ඇතැමුන්ගේ සේයා රූ ද ඇතුළත්ව නම් කරන ලද සියළු පුද්ගලයන්[8] | | | 19,700 |
| ශ්‍රී ලංකා ආණ්ඩුවේ ගණනය කිරීම් - ආගිය අතක් නොමැති සිවිල් වැසියන් සහ සටන්කරුවන්[9] | 7,000 | 2,500 | 9,500 |
| **යුද්ධයට පෙර වන්නි ජනගහණයෙන් යුද්ධයට පසු ජනගහණ සංඛ්‍යා අඩු කිරීමෙන් සිදුකළ ඇස්තමේන්තු** | ගණනය නොකළ සංඛ්‍යා | | |
| 2009 ජනවාරි 22 වැනිදා යුද මුක්ත කලාපයේ සිටි 360,000න් දිවි ගළවාගත් 272,380 අඩුකිරීම - දෙමළ ජාතික සන්ධානය | 87,620 | | |
| පෙබරවාරි මුල් භාගයේ යුද මුක්ත කලාපයේ සිටි 330,000[10] සහ පිටත කඳවුරුවල සිටි 35,000න් දිවි ගළවාගත් 272,380 අඩුකිරීම | 83,000 | 0 | |
| 2008 ඔක්තෝබර් වනවිට 429,000ක්[11] වන්නි ජනගහණයෙන් දිවි ගළවාගත් 282,000 අඩුකිරීම (මන්නාරමේ රදගුරු) | 147,000 | 0 | |
| ලෝක බැංකුවේ ගෘහාශ්‍රිත දත්ත ගණනයන්[12] | 169,796 | 0 | |
| කිලිනොච්චි සහ මුලතිවු ආගිය අතක් නොමැති ජනගහණ සංඛ්‍යා පිළිබඳ ජාත්‍යන්තර අර්බුද කණ්ඩායම (ICG)[13] | 100,000 | | |

# පාද සටහන්

කවරයේ සේයා රූ War Without Witness වාර්තාවේ අනුග්‍රහයෙනි. http://www.warwithoutwitness.com/victims-of-sri-lankan-governments-genocidalwar-20000-identities-cases-confirmed-by-war-without-witness/

1. සමස්ත යුද කාලයට අදාළව ආගිය අතක් නොමැති යැයි පරණගම කොමිසම විසින් දක්වන 23,586 මීට ඇතුළත් නොවේ. http://nirmin.gov.lk/index.php?option=com_content&view=article&id=127:office-on-missing-personsomp&catid=9&Itemid=208&lang=en.

2. තුවාල ලැබූවන්ගෙන් මියගිය සංඛ්‍යාවේ ප්‍රමාණය අපැහැදිලිය; යුද මුක්ත කලාපයන් තුළ රෝහල්, ශල්‍යවෛද්‍යින් හා ඖෂධ හිඟයක් තිබුණු අතර යුද්ධයේ අවසාන මාස කිහිපය තුළ බරපතල තුවාල ලැබූවන්ට යුද කලාපයෙන් බැහැරව ප්‍රතිකාර ලබාගැනීම සඳහා දුෂ්කර සාගර චාරිකාවක යෙදෙන්නට සිදුවිය. එසේ ඉවත්කරන ලද්දේ වාර්තා වූ තුවාලකරුවන්ගේ සමස්ත සංඛ්‍යාවට වඩා අඩු සංඛ්‍යාවක් වූ 14,000ක ප්‍රමාණයකි.

3.COG දත්ත උපුටා දක්වන පෙට්‍රි වාර්තාවේ ඇමිණුම (§211)

එක්සත් ජාතීන්ගේ අර්බුද මෙහෙයුම් කණ්ඩායම (COG) ස්ථාපිත කරන ලද්දේ දුරකථන ඔස්සේ හානිපත් සංඛ්‍යාවන් පිළිබඳ තොරතුරු දුරස්ථව රැස්කිරීම සඳහා ය. අදාළ ගණනයන් එම කණ්ඩායම විසින් අතිශය සාම්ප්‍රදායිකව සිදුකරන ලද්දේ හානිපත් වූවන් පිළිබඳ ස්වාධීන මූලාශ්‍ර තුනකින් තහවුරු කරන ලද දත්ත (ත්‍රිකෝණික තහවුරු කිරීම්) පමණක් උපුටා දක්වමිනි. හානියට පත්වන්නන්ගේ සංඛ්‍යාවන් ඉතාමත් අයහපත් වූ යුද්ධයේ අවසාන සති තුන තුළදී ඔවුහු තොරතුරු රැස්කිරීම නැවැත්වූහ.

කෙසේවුවද, තමන්ට ලැබෙන්නේ හානිපත්වූවන් පිළිබඳ යථා සංඛ්‍යා දත්තවලින් කුඩා පංගුවක් පමණක් බව එක්සත් ජාතීන්ගේ අර්බුද මෙහෙයුම් කණ්ඩායම දැන සිටියේයැයි පෙට්‍රි වාර්තාව කියා සිටියි. මීට අමතරව, කාලයත් සමග හානිපත්වූවන්ගේ සංඛ්‍යාවන් බරපතල ලෙස ඉහළ යාමේදී සෑම ජීවිත හානියක්ම තහවුරු කරගැනීම සඳහා ස්වාධීන මූලාශ්‍ර තුනක් සපයාගැනීමේ හැකියාව COG ට වඩාත් දුෂ්කර විය. අවසාන සති කිහිපය තුළ සටන්වල තීව්‍රතාව ඉහළ යාම හමුවේ දත්ත රැස්කිරීම අතිශය අසීරු විය.

4. පෙට්‍රි වාර්තාව.

5. https://wikileaks.org/plusd/cables/09COLOMBO539_a.html

2009 එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තු වාර්තාව: “**සිවිල් වැසියන් සහ සිවිල් දේපළවලට සිදු වූ හානි** - වාර්තා කෙරෙන සමස්ත කාලය සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි හානිපත්වූවන් පිළිබඳ ඇස්තමේන්තු රාජ්‍ය දෙපාර්තමේන්තුවට ලැබී නැත; ප්‍රහාරයන් සිදුවන මොහොතේදී සිදු වූ මරණ හා තුවාල ලැබූවන් පිළිබඳ බරපතල සංඛ්‍යාවන් බොහෝදුරට කිසිවිටක වාර්තා නොකරන ලද බවට මූලාශ්‍ර විසින් චෝදනා කරනු ලබයි....මීට හේතුව, හානිපත්වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන බහුතරයක් පදනම් වී ඇත්තේ ප්‍රතිකාර මධ්‍යස්ථානවලට මාරුකරන ලද ජනයා අතරින් මියගියවුන් හෝ ප්‍රහාරයන් ඇසින් දුටුවන් විසින් කරන ලද වාර්තාකිරීම් මත ය. ප්‍රහාරයන් සිදුවන මොහොතේදී සිදු වූ මරණ හා තුවාල ලැබූවන් පිළිබඳ බරපතල සංඛ්‍යාවන් බොහෝදුරට කිසිවිටක වාර්තා නොකරන ලද බවට මූලාශ්‍ර විසින් චෝදනා කරනු ලබයි.

6. https://wikileaks.org/plusd/cables/09COLOMBO539_a.html

7. පෙට්‍රි වාර්තාව §34.

8.http://www.warwithoutwitness.com/victims-of-sri-lankan-governments-genocidal-war-20000-identitiescases-confirmed-by-war-without-witness/

මරණයත් පත් සහ තුවාල ලැබූවන්ගේ සංඛ්‍යාවන්ගෙන් තමන් විසින් හඳුනාගන්නා ලද්දේ 25.7%ක් පමණක් බැව් එක්සත් ජාතීන්ගේ අර්බුද මෙහෙයුම් කණ්ඩායම පවසයි. ඒ නිසාම, සාක්ෂිකරුවන් නොමැති යුද්ධය (War Without Witness) වාර්තාවේ ලැයිස්තුගත පුද්ගල නාමලේඛනයන් ද සමස්තයෙන් කුඩා පංගුවක් පමණක් ද යන ප්‍රශ්නය මතු වේ.

9.https://www.crisisgroup.org/asia/south-asia/sri-lanka/sri-lankas-dead-and-missing-need-accounting

10.සහකාර රජයේ ඒජන්තවරයාගේ සංඛ්‍යාව: https://www.crisisgroup.org/asia/south-asia/sri-lanka/srilankas-dead-and-missing-need-accounting සහ රජයේ ඒජන්තවරයා විසින් දක්වන 365,000

11. ICG වාර්තාව බලන්න - කිලිනොච්චි සහ මුලතිවු පළාත් පාලන කාර්යාලවල 2008 සැප්තැම්බර් 30 සහ ඔක්තෝබර් 01 දා යන දාතමින් යුතු ලේඛනවලින් ලබාගත් සංඛ්‍යාවන්

http://www.jdslanka.org/images/ documents/tna_response_llrc_report.pdf.

12.

| ලෝක බැංකු දත්ත | **2007 රජයේ ගෘහාශ්‍රිත දත්ත** | **නැවත පදිංචි කිරීම සම්පූර්ණ කළ පසු ගෘහාශ්‍රිත දත්ත** | ආගිය අතක් නොමැති ගෘහාශ්‍රිතයන් | ආගිය අතක් නොමැති අය |
|---|---|---|---|---|
| මුලතිවු | 54,336 | 28,889 | 25,447 | 101,788 |
| කිලිනොච්චි | 53,049[12] | 36,047 | 17,002 | 68,008 |
| | | | | **169,796** |

13.https://www.crisisgroup.org/asia/south-asia/sri-lanka/sri-lankas-dead-and-missing-need-accounting